ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය
இலங்கை உழைக்கும் ஊடகவியலாளர் சங்கம்
Sri Lanka Working Journalists Association
Incorporated by Parliament Act No.46 in1987/Trade Union Registration No 8528
No.276/3, PRADEEPA MAWATHA, MALIGAWATTE, COLOMBO-10, SRI LANKA | TEL : 0112439276

2019.04.22
කොළඹ

# මාධ්‍ය නිවේදනය

ජීවිත රැසක් විනාශ කරමින් සහ පුද්ගලයින් විශාල පිරිසකට තුවාල සිදුකරමින් පාස්කු ඉරුදින (21) කොළඹ කොච්චිකඩේ, මීගමුව කටුවාපිටිය, සහ මඩකලපුව දේවස්ථානයන්හිද, ෂැංග්‍රිලා සිනමන් ග්‍රෑන්ඩ් සහ කිංග්ස්බරි යන අගනුවර සුපිරි හෝටල් තුළ ද, දෙහිවල ට්‍රොපිකල් ඉන් ලැගුම්හලේ සිදුවූ ම්ලේච්ඡ බෝම්බ ප්‍රහාරයන් ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍ය සංගමය පිළිකුලෙන් යුතුව හෙලා දකින්නෙමු.

ජීවිත අහිමි වූ පුද්ගලයින්ගේ පවුල් වෙත අපගේ බලවත් කණගාටුව පළකර සිටින අතර තුවාල ලැබූ සියළු දෙනා හට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරන්නෙමු.

රජය සහ ආරක්ෂක අංශ මෙයට වඩා සැළකිලිමත්ව කටයුතු කළේ නම් මෙවැනි තත්වයක් වලක්වා ගැනීමට හෝ සිදු වූ ජීවිත හා දේපළ හානි අවම කරගැනීමට හැකිව තිබූ බව අපගේ විශ්වාසයයි.

විශේෂයෙන් මෙම අවස්ථාව වාර්තාකිරීමේදී යහපත් ලෙස මාධ්‍ය භාවිතාවේ යෙදුනු සියළුම මාධ්‍ය ආයතන හා මාධ්‍යවේදීන්හට අප සංගමයේ කෘතඥතාවය පළකර සිටින අතර මෙම අර්බුදකාරී අවස්ථාවේදී ගැටුම්කාරී තත්වයන් ඇතිනොවන ආකාරයෙන් හා ව්‍යාජ පුවත් වාර්තාකරණයෙන් බැහැරව මාධ්‍යවේදීන් හා මාධ්‍ය ආයතන තම වගකීම නිසිලෙස ඉටුකරනු ඇතැයි අප සංගමය බලාපොරොත්තු වෙමු.

| | |
|---|---|
| ........................ | ........................ |
| දුමින්ද සම්පත් | ෆ්‍රෑන්ක් ද සොයිසා |
| සභාපති | ලේකම් |

| President | General Secretary | Treasurer | National Organizer |
|---|---|---|---|
| Duminda Sampath | Frank De Zoysa | T. Nadarasa | Nimal Abeysinghe |
| +94 773181731 | +94 715493815 | +94 714967528 | +94 0779868010 |
| dsampath15@gmail.com | frankdezoysa@gmail.com | tnada21@gmail.com | nimalabesinghe589@gmail.com |